


# 24 දත්ත නිරූපණය හා අර්ථකථනය

මෙම පාඩම අධ්‍යයනය කිරීමෙන් ඔබට,
- වගු මගින් නිරූපිත දත්ත අර්ථකථනය කිරීමට සහ
- චිත්‍ර ප්‍රස්තාර මගින් නිරූපිත දත්ත අර්ථකථනය කිරීමට

හැකියාව ලැබේ.

## 24.1 වගු මගින් නිරූපිත දත්ත අර්ථකථනය කිරීම

දත්ත විධිමත් ලෙස නිරූපණය කිරීම සඳහා චිත්‍ර ප්‍රස්තාරයක් හෝ ප්‍රගණන වගුවක් හෝ භාවිත කරන ආකාරය, දත්ත රැස්කිරීම හා නිරූපණය පාඩමේදී ඉගෙන ගත්තෙමු.
වගු මගින් හෝ චිත්‍ර ප්‍රස්තාර මගින් හෝ නිරූපණය කර ඇති දත්ත මගින් විවිධ වූ තොරතුරු ලබා ගත හැකි ය. මෙසේ විවිධ තොරතුරු ලබා ගෙන එමගින් නිගමනවලට එළැඹීම **දත්ත අර්ථකථනය** ලෙස හැඳින්වේ.

දැන් අපි පළමුව වගු මගින් නිරූපිත දත්ත සලකමු. පහත දැක්වෙනුයේ එක්තරා පිරිවෙණක පළමු ශ්‍රේණියේ සිසුන් 5 දෙනෙකු වාර පරීක්ෂණයකදී ගණිතය සඳහා ලබා ගන්නා ලද ලකුණු ඇතුළත් වගුවකි.

| නම | ලකුණු |
|---|---|
| සුනීත හිමි | 45 |
| ධම්මසාර හිමි | 65 |
| කුසලධම්ම හිමි | 50 |
| සෝරත හිමි | 19 |
| විපස්සී හිමි | 40 |

මෙහි එක් එක් සිසුවා ලබා ගත් ලකුණු පිළිබඳ නිගමන කිහිපයකට එළඹීම සඳහා පහත දැක්වෙන ප්‍රශ්න සළකා බලමු.

- කුසලධම්ම හිමිට වඩා ධම්මසාර හිමි, ගණිතය විෂය සඳහා වැඩිපුර ලකුණු කීයක් ලබා ගෙන තිබේ ද?

  ධම්මසාර හිමි ලබා ගත් ලකුණු ගණන $= 65$
  කුසලධම්ම හිමි ලබා ගත් ලකුණු ගණන $= 50$
  කුසලධම්ම හිමිට වඩා ධම්මසාර හිමි ලබා ගත් ලකුණු ගණන $\} = 65 - 50$
  $= 15$

- ලකුණු 30ට වඩා අඩුවෙන් ලබා ගත් හිමි නම කවු ද?
  සෝරත හිමි
- ලකුණු 70ට වඩා වැඩියෙන් ලබා ගත් අයෙකු සිටියේ ද?
  නැත
- සිසුන් 5 දෙනා ලබා ගත් ලකුණු ආරෝහණ පිළිවෙළින් ලියූ විට එම ලකුණුවලට අදාළ හිමිවරුන්ගේ නම් එම පිළිවෙළින් ලියන්න. (ආරෝහණ පිළිවෙළ යනු අඩුම අගයේ සිට වැඩිම අගය දක්වා අගය වැඩිවන පිළිවෙළයි.)
  සෝරත හිමි, විපස්සී හිමි, සුනීත හිමි, කුසලධම්ම හිමි, ධම්මසාර හිමි

**24.1 අභ්‍යාසය**

1. එක්තරා ජෑම් නිෂ්පාදන ආයතනයක සතියක් තුළ නිපදවන ලද විවිධ වර්ගවල ජෑම් බෝතල් ගණන පහත දැක්වේ.

| ජෑම් වර්ගය | බෝතල් ගණන |
|---|---|
| අන්නාසි | 500 |
| අඹ | 350 |
| දිවුල් | 400 |
| මිශ්‍ර පලතුරු | 600 |
| ස්ට්‍රෝබෙරි | 550 |

වගුව ඇසුරෙන් පහත දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) අඩුවෙන් ම නිපදවන ලද ජෑම් වර්ගය කුමක් ද?
(ii) වැඩියෙන් ම නිපදවන ලද ජෑම් වර්ගය කුමක් ද?
(iii) දිවුල්වලට වඩා මිශ්‍ර පලතුරු ජෑම් බෝතල් කොපමණ ප්‍රමාණයක් සතිය තුළ නිපදවයි ද?

2. පිරිවෙණක පුස්තකාලයක් සතු පොත් පිළිබඳ තොරතුරු ඇතුළත් වගුවක් පහත දැක්වේ.

| පොත් වර්ගය | පොත් ගණන |
|---|---|
| නව කථා | 725 |
| කෙටි කථා | 875 |
| ළමා පොත් | 350 |
| සඟරා | 126 |
| කවි පොත් | 265 |
| ශාස්ත්‍රීය පොත් | 148 |

මෙම වගුව අනුව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) පුස්තකාලයේ පොත් වර්ග කීයක් තිබේ ද?
(ii) වැඩිපුර ම ඇත්තේ කුමන වර්ගයේ පොත් ද?
(iii) සඟරාවලට වඩා ළමා පොත් කීයක් තිබේ ද?
(iv) පුස්තකාලයේ තිබෙන මුළු පොත් ගණන කොපමණ ද?

3. පහත දැක්වෙනුයේ කිසියම් වර්ෂයක ජනවාරි සිට ජුනි මාසය දක්වා අනුරාධපුර පූජා භූමිය වෙත පැමිණි බැතිමතුන් ගණන දැක්වෙන වගුවකි.

| මාසය | බැතිමතුන් ගණන |
|---|---|
| ජනවාරි | 121 500 |
| පෙබරවාරි | 323 650 |
| මාර්තු | 230 708 |
| අප්‍රේල් | 440 575 |
| මැයි | 376 700 |
| ජුනි | 1 450 708 |

අසා ඇති ප්‍රශ්නවලට වගුව අනුව පිළිතුරු සපයන්න.

(i) අඩුම බැතිමතුන් සංඛ්‍යාවක් පැමිණ ඇත්තේ කුමන මාසයේ ද?


(ii) ජනවාරි මාසයට වඩා කොපමණ බැතිමතුන් සංඛ්‍යාවක් පෙබරවාරි මාසයේ පැමිණ තිබේ ද?

(iii) පෙබරවාරි හා මාර්තු මාසවල පැමිණි මුළු බැතිමතුන් සංඛ්‍යාව කීය ද?

(iv) ජුනි මාසයේ පැමිණි බැතිමතුන් ගණන පිළිබඳව ඔබට කුමක් කිව හැකි ද? එසේ වීමට හේතුව කුමක් ද?

## 24.2 චිත්‍ර ප්‍රස්තාර මගින් නිරූපිත දත්ත අර්ථකථනය

සතියේ දින 5 තුළ කිරි වෙහෙර අසළ මල් වෙළඳසැලක අලෙවි වූ නෙළුම් මල් ගණන දැක්වෙන චිත්‍ර ප්‍රස්තාරයක් පහත දැක්වේ.




 සලකුණෙන් නෙළුම් මල් 100ක් නිරූපණය කර ඇත.


මෙම චිත්‍ර ප්‍රස්තාරය ඇසුරෙන් අපට විවිධ අර්ථකථනයන් ඉදිරිපත් කළ හැකි අතර ඉන් කිහිපයක් සලකා බලමු.




- එම දින 5 තුළ වැඩිපුර ම නෙළුම් මල් අලෙවි වූ දිනය බදාදා ය.
- බදාදා අලෙවි වූ නෙළුම් මල් ගණන750කි.
- සමාන නෙළුම් මල් ගණනක් අලෙවි වූ දිනයන් වන්නේ සඳුදා හා බ්‍රහස්පතින්දා ය.
- අඩුම නෙළුම් මල් ගණනක් අලෙවි වූ දිනය අඟහරුවාදා ය. එදින අලෙවි වූ නෙළුම් මල් ගණන 400කි.
- නෙළුම් මල් 600ට වඩා වැඩි ගණනක් අලෙවි වූ දිනයන් වන්නේ බදාදා හා සිකුරාදා ය.
- අඟහරුවාදාට වඩා බ්‍රහස්පතින්දා නෙළුම් මල් 100ක් වැඩිපුර අලෙවි කර තිබුණි.

## 24.2 අභ්‍යාසය



1. බයිසිකල් වෙළඳසැළක මුල් මාස 4 තුළ අලෙවි වූ පා පැදි ප්‍රමාණය දැක්වෙන චිත්‍ර ප්‍රස්තාරයක් පහත දැක්වේ.




 සලකුණෙන් පා පැදි 50ක් නිරූපණය කර ඇත.

(i) අඩුවෙන් ම පා පැදි අලෙවි වී ඇති මාසය කුමක් ද?
(ii) මාර්තු මාසයේ අලෙවි වී ඇති පා පැදි ගණන කොපමණ ද?
(iii) මාස හතර තුළ අලෙවි වූ මුළු පා පැදි සංඛ්‍යාව කොපමණ ද?
(iv) පෙබරවාරි මාසයේදී අලෙවි වූ පාපැදි ප්‍රමාණය මාර්තු මාසයේ දී අලෙවි වූ පා පැදි ප්‍රමාණය මෙන් දෙගුණයක් බව පෙන්වන්න.


2. දහම් පාසලක ජනවාරි මාසයේ ඉරිදා දින 4 තුළ පැමිණි සිසුන් ගණන දැක්වෙන චිත්‍ර ප්‍රස්තාරයක් පහත දැක්වේ.

| | |
|---|---|
| පළමුවන ඉරිදා |  |
| දෙවන ඉරිදා |  |
| තුන්වන ඉරිදා |  |
| සිව්වන ඉරිදා |  |

 සලකුණෙන් ළමුන් 50ක් නිරූපණය කර ඇත.

(i) වැඩිපුර ළමුන් දහම් පාසල් පැමිණ ඇත්තේ කවර ඉරිදා ද?
(ii) අඩුවෙන් ළමුන් දහම් පාසල් පැමිණ ඇත්තේ කවර ඉරිදා ද?
(iii) දෙවන ඉරිදා දහම් පාසල් පැමිණි සිසුන් ගණන කොපමණ ද?
(iv) ඉරිදා දිනයන් හතරේදී දහම් පාසල් පැමිණි මුළු සිසුන් ගණන කොපමණ ද?

3. එක්තරා වර්ෂයකදී ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයින් සංඛ්‍යාව පිළිබඳ විස්තරයක් චිත්‍ර ප්‍රස්තාරය මගින් දැක්වේ.

| | |
|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය |  |
| මාල දිවයින |  |
| මැලේසියාව |  |
| රුසියාව |  |

 සලකුණෙන් විදේශිකයින් 1000ක් නිරූපණය කර ඇත.

(i) වැඩිපුර ම විදේශකයින් පැමිණ ඇත්තේ කවර රටකින් ද?
(ii) අඩුවෙන් ම විදේශකයින් පැමිණ ඇත්තේ කවර රටකින් ද?
(iii) රුසියාවේ සිට පැමිණි විදේශිකයින් ගණන කොපමණ ද?
(iv) රටවල් හතරෙන් ම පැමිණි මුළු විදේශිකයින් ගණන කොපමණ ද?

**සාරාංශය**

- වගුවක සංඛ්‍යාත්මකව දත්ත දක්වා ඇති විට, එම සංඛ්‍යා ඇසුරෙන් දත්ත අර්ථකථනය සිදු කළ හැකි ය.
- චිත්‍ර ප්‍රස්තාරවලින් දත්ත නිරූපණය කර ඇති විට, ඒවා සංසන්දනය මගින් දත්ත අර්ථකථනය වඩාත් පහසු ය.